**“Y”**

<u>කොළඹ දිසා අධිකරණයේදී ය.</u>

කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවතේ, අංක.167/4 දරණ ස්ථානයේ නිහාල් ශ්‍රී අමරසේකර.

<u>පැමිණිලිකරු.</u>

| | | |
|---|---|---|
| නඩු අංකය | : 3155/විශේෂ | එදිරිව |
| ස්වභාවය | : විශේෂ | |
| වටිනාකම | : රු.100,000/- | |
| කාර්ය පටිපාටිය | : සාමාන්‍ය | |

1. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, චියෝඩා-කු, ඕටමචි 1-චෝම් හි 2-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන සහ කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315, දරණ ස්ථානයේ, ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන මිට්සුයි ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්.

2. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, ෂින්ජුකු-කු, නිෂි-ෂින්ජුකු 1-චෝම් හි 25-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන හා මහරගම, හයිලෙවල් පාරේ, අංක.65 දරණ ස්ථානයේ ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන තායිසෙ කෝපරේෂන්.

3. ජාපනයේ නීති යටතේ නිසි ලෙස සංවිධානය වී තිබෙන සංස්ථාවක් වන සහ ජපානයේ ටෝකියෝ නුවර, මිනාටෝ-කු, අටාගෝ 1-2-2, මොරි ගොඩනැගිල්ලේ අංක.9 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන ගෘහ නිර්මාණ ශිල්පීන්

සහ සැලසුම්කරුවන් වන කන්තො කිකාකු සෙක්කිෂා යෝෂෝ ෂිබාටා ඇන්ඩ් ඇසෝෂියේට්ස්.

4. කලින් ලංකා ජැපෑන් හොටෙල්ස් ලිමිටඩ් වශයෙන් හැඳින් වූ සහ කොළඹ 03, ඇල්ෆ්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයේ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්.

5. කොළඹ 03, ඇල්ෆ්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයෙහි හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ කෝර්නල් ලයනල් පෙරේරා.

6. කොළඹ 03, ධර්මපාල මාවතේ, අංක.51/3 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ ෆ්‍රෙඩ්රික් ජර්මේන් නොයෙල් මෙන්ඩිස්.

7. කොළඹ 07, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවතේ, අංක.23/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කයිර්ෂාස්ප් නරිමාන් චොක්සි.

8. කොළඹ 06, හැව්ලොක් පාරේ, අංක.696/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ දොන් පීටර් සෙවරිනස් පෙරේරා.

9. ජපානයේ, කසගාව, චිගසාකි, ෆුජිමිචෝ, 6-38 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කෂුටාකා කොබෝයි.

10. කොළඹ 06, රාමක්‍රිෂ්ණා මාවතේ, අංක.4 දරණ ස්ථානයේ සහ හොටෙල් ඉඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කනපතිපිල්ලේ ශන්මුගලිංගම්.

11. දැනට කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කොජි ඉතෝ.

<u>විත්තිකරුවෝ.</u>

<u>ඉහත නම සඳහන් 3 වැනි විත්තිකරු වෙතය.</u>

(3 වැනි විත්තිකාර සමාගමේ නීති උපදේශක, කොළඹ 12, අළුත්කඩේ වීදියේ, අංක.136 හි එස්.ඩී.යෝගේන්ද්‍ර මහතා මඟින් භාර කරවනු පිණිස)

<u>ඉහත නම සඳහන් 3 වැනි විත්තිකරුගෙන් ප්‍රශ්න කිරීම සඳහා පැමිණිලිකරු වෙනුවෙන් වන විචාරණ,</u>

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 94 වගන්තිය ප්‍රකාර, පහත සඳහන් සියළුම විචාරණයන්ට, මෙය භාරදීමේ දී සිට, **<u>දින දහයක් (10)</u>** ඇතුළත ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලබේ.

1. ඉහත නම සඳහන් 4 වැනි විත්තිකාර සමාගමට අයිති කොළම හිල්ටන් හෝටලයේ නිර්මාණ ශිල්පීන් වශයෙන් නිර්මාණ ශිල්පි වෘත්තිය පිළිබඳ වෘත්තීය ව්‍යවහාර සහ අනුකූලව සහ ඒ අනුව වෘත්තීය සේවාවන් ඉටු කිරීමට සහ යුතුකම් වගකීම් සහ බැඳීම් ක්‍රියාත්මක කිරීමට ඔබ වෘත්තීය වශයෙන් බැඳී සිටින බව පිළි ගන්නේ ද? එසේ නොමැති නම්, ඒ මන්ද?

2. 4 වැනි විත්තිකාර සමාගමේ කොළඹ හිල්ටන් හෝටලයේ නිර්මාණ ශිල්පීන් වශයෙන් ඔබ සහ එම 4 වැනි විත්තිකාර සමාගම විසින් සහ අතර බැඳී ඇතුළත් වන්නට යෙදුණු (පැ.14) සැලසුම් සහ අධීක්ෂණ ගිවිසුමේ විධිවිධානයන් අනුව සහ ඒ යටතේ එයට අනුකූලව වෘත්තීය සේවාවන් ඉටු කිරීමට සහ යුතුකම් වගකීම් සහ බැඳීම් ක්‍රියාත්මක

කිරීමට ඔබ කොන්ත්‍රාත්තු ගතව බැඳී සිටි බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නොමැති නම්, ඒ මන්ද?

3. ඔබ විසින් ඇඳ ඉදිරිපත් කරනු ලැබූ හිල්ටන් හෝටලය සඳහා මුල් නිර්මාණ සැලසුම් 1984 ජනවාරි මස හෝ ඊට ආසන්නයේ දී එහි 4 වැනි විත්තිකාර සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාගත කොට අනුමත කළ බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නොමැති නම් ඒ මන්ද?

4. කොළඹ හිල්ටන් හෝටලය සඳහා ඔබ විසින් ඇඳ ඉදිරිපත් කරනු ලැබූ මුල් නිර්මාණික සැලසුම්වල පිටපතක් 1983 ඔක්තෝබර් මස හෝ ඊට ආසන්නයේ දී නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදුව, නාගරික සංවර්ධන අධිකාරියෙන් එයට අනුමැතිය 1984 මාර්තු මස හෝ එයට ආසන්නයේ දී ලද බව ඔබ පිළි ගන්නෙහි ද? තවද, ගෙපල් කැපීමේ උත්සවයකින් කොළඹ හිල්ටන් හෝටලය 1984 මාර්තු මස දී ආරම්භ කළ බව ඔබ පිළි ගන්නෙහි ද?

5. මෙම නඩුවට වැදගත් සියළු කල්හිම, 4 වැනි විත්තිකාර සමාගමේ එදිනෙදා පරිපාලනමය කළමණාකරණය සහ කටයුතු පූර්ණ ලෙසින් භාරව, 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයා එහි පූර්ණකාලීන විධායක අධ්‍යක්ෂ වශයෙන් කටයුත කල බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන් ද?

6. ඉහත සඳහන් පරිදි එකී 4 වැනි විත්තිකාර සමාගමේ විධායක අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කළ එම 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයා කොළඹ හිල්ටන් හෝටල ව්‍යාපෘතියේ නිර්මාණ ශිල්පීන් වන ඔබගේ කටයුතු නියම කරමින් උපදෙස් දුන් බව නැතහොත්, එවැනි නියමයන් සහ උපදෙස් ඔහුගෙන් ඔබ විසින් නියත වශයෙන්ම ලබාගත් බව ඔබ පිළි ගන්නෙහි ද?

7. ඔබගේ අවසන් සහතිකය නිකුත් කිරීමට පෙරාතුව කොළඹ හිල්ටන් හෝටලය පිළිබඳව ස්වාධීන ඉංජිනේරුවකු ලබා ස්වාධීන පරීක්ෂණයක් සහ හරිවැරදි සොයා බැලීමේ භෞතික පිරික්සුමක් පැවැත්වීම 4 වැනි විත්තිකාර සමාගමේ ඉහත කී විධායක අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කළ 1 වැනි සහ/ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයා විසින් විරුද්ධ වී වලක්වාලනු ලැබූ බව ඔබ දන්නෙහි ද?

8. එම කොළඹ හිල්ටන් හෝටලයේ අවසන් පරීක්ෂණය ඔබ විසින් 1988 මාර්තු මස 24/25 පමණ දී හෝ එයට ආසන්නයේ දී ඔබ විසින් කරන ලද බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම්, ඒ මන්ද?

9. අර්නස්ට් සහ යං සමාගමේ ප්‍රධාන හවුල්කාර වරලත් ගණකාධිකාරි ඊ.එම්.ටී.එල්.ප්‍රනාන්දු මහතා විසින් රජය විසින් නම් කරනු ලැබූ අධ්‍යක්ෂ වශයෙන්, එවැනි ස්වාධීන පරීක්ෂණයක් ඉල්ලා සිටි බව ඔබ පිළි ගන්නෙහි ද?

10. එම කොළඹ හිල්ටන් හෝටලයේ ස්වාධීන පරීක්ෂණයක් සඳහා වූ ඉහත කී යෝජනාව 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් විසින් ඔබ වෙත දන්වා නොසිටියෙහි ද? එසේ නොකළේ නම්, ඔවුන් විසින් එය නොකළ යුතුව තිබුණි ද?

11. ඉහත සඳහන් පරිදි ඉල්ලා සිටි එවැනි ස්වාධීන පරීක්ෂණයක් කිසි විටෙකවත් නොකළ බව ඔබ පිළි ගන්නෙහි ද?

12. එම කොළඹ හිල්ටන් හෝටලයේ අවසන් පරීක්ෂණය ඔබ විසින් 1988 මාර්තු 24/25 පමණ හෝ එයට ආසන්නයේ දී ක්‍රියාත්මක කළේ වී නමුත්, ඔබ විසින් ඔබගේ අවසාන සහතිකය නිකුත් කරනු ලැබුවේ, ඉහත සඳහන් පරිදි ඉල්ලා සිටි ස්වාධීන පරීක්ෂණයට විරුද්ධව 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණයක් ගනු ලැබීමෙන් පසුව 1988 අගෝස්තු 25 දින හෝ එදිනට ආසන්නයේ දී පමණක් බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නොමැති නම්, ඒ මන්ද?

13. කොළඹ හිල්ටන් හෝටලය මෙහෙයුම් සඳහා විවෘත කිරීමෙන් පසුව, එම කොළඹ හිල්ටන් හෝටලයේ ඇත්ත වශයෙන්ම තනා තිබූ හෝටල අමුත්තන්ගේ කාමර සංඛ්‍යාවේ නිවැරදිතාවය පිළිබඳව පැමිණිලිකරු විසින් 1987 වසරේ දී එම 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගෙන් ප්‍රශ්න කරන්නට යෙදුණු බව ඔබ දන්නෙහි ද?

14. එම විමසීම් සහ/හෝ වෙනස්කම් පිළිබඳව එකී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයින් ඔබ සමග සාකච්ඡා කළේ ද? එසේ නොකළේ නම්, එය නොකළ යුතුව තිබුනේ ද?

15. ඔබ විසින් ද අනු අත්සන යෙදූ ඉදිකිරීම් ගිවිසුමේ (පැ.11) වෙනත් දේ අතර, මහල් 22 ක් ද නියම කර තිබුණු බව ඔබ පිළි ගන්නෙහි ද?

16. ඔබ විසින් සහතික කරනු ලැබූ, එකී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් විසින් අත්සන් කොට කරනු ලැබූ එම කොළඹ හිල්ටන් හෝටලය ඉදි කිරීමේ මාසික ප්‍රගති වාර්තාවන් හි කොළඹ හිල්ටන් හෝටලයේ ඇත්ත වශයෙන්ම තනා තිබූ මහල් සංඛ්‍යාව 20 ක් පමණක් බව පිළිගෙන, එලෙස සහතික කොට ඇති බව ඔබ පිළි ගන්නෙහි ද?

17. එම කොළඹ හිල්ටන් හෝටලයේ ඇත්තවශයෙන්ම ඉදි කර තිබූ මහල් සංඛ්‍යාව පිළිබඳව ඔබගේ එවැනි සහතික කිරීම, එම ඉදිකිරීම් ගිවිසුමෙහි එකී නියමය කඩ කිරීමක් සහ උල්ලංඝණය කිරීමක් වන බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැත්නම්, ඒ මන්ද?

18. ඔබ කිසි විටෙකවත් 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී වූයේ ද? එසේ නම්, ඒ කුමන දිනයන්හි ද? කුමන ස්ථානයන්හිදී ද? තවද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ඔබ වෙනුවෙන් පෙනී සිටින ලද්දේ කවුරුන් ද?

19. හෝටල අමුත්තන්ගේ කාමර 452 ක පදනම මත පිළියෙළ කොට 1 වැනි විත්තිකරු විසින් ඉදිරිපත් කරනු ලැබූ පූර්වානුමාන ලාභදායී ප්‍රකාශ සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපණයන් සහ ව්‍යාපාර ප්‍රකාශ පත්‍රය අනුව හෝටල අමුත්තන්ගේ කාමරවල අඩුකම පිළිබඳව 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයින්ගෙන් 1990 පෙබරවාරි/මාර්තු පමණ හෝ ඊට ආසන්නයේ දී මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රශ්න නැගූ බව ඔබ දන්නෙහි ද?

20. එවැනි ප්‍රශ්න සහ/හෝ අඩුකම් පිළිබඳව 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් ඔබ සමඟ සාකච්ඡා කරන ලද්දේ ද? එසේ නොකළේ නම්, එය ඔවුන් විසින් කළයුතුව තිබුණා නොවේ ද?

21. එකී කොළඹ හිල්ටන් හෝටලය ඉදිකොට භාරදීම මත මුල් ණය මුදලින් මූලික මුදල/ප්‍රාග්ධනය මත 30% ක කපා හැරීමක් 1990 පෙබරවාරි/මාර්තු පමණ හෝ ඊට ආසන්නයේ දී මුදල් අමාත්‍යාංශය විසින් 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගෙන් ඉල්ලා සිටි බැව් ඔබ දන්නෙහි ද?

22. එම ඉල්ලීම පිළිබඳව 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් ඔබ සමඟ සාකච්ඡා කළේ ද? එසේ නොකළේ, නම් ඔවුන් විසින් එය කළ යුතුව තිබුණා නොවේ ද?

23. ඔබගෙන් නිශ්චිත කරුණු පැහැදිලි කිරීමක් ලැබෙන තෙක් එකී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් වෙත කිසිදු හෝ මුදලක් ගෙවීම පිළිබඳව 1989 නොවැම්බර් සහ 1989 දෙසැම්බර් මාසයන් හි 4 වැනි විත්තිකාර සමාගම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී පැමිණිලිකරු විරෝධතා දක්වා සිටි බව ඔබ දන්නෙහි ද?

24. ඒ සම්බන්ධයෙන් 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් ඔබට දන්වා සිටියේ ද? එසේ නොකළේ නම් ඔවුන් විසින් එසේ නොකළ යුතුව තිබුණා නේද? එසේ නම් ඔවුන් එසේ කළේ කවදා ද?

25. පැමිණිල්ලෙහි 'උ' සහ 'ඌ' ආයාචනයන්ගෙන් අයැද ඇති ප්‍රකාර අතුරු තහනම් නියෝග නිකුත් කරමින් වෙනත් දේ අතර, පෙනී යන සැළකිය යුතු තත්ත්වය වනුයේ, මුදල්

ගෙවීමක් කළ යුතු සමාගමක් සාමාන්‍යයෙන් එවැනි තත්ත්වයක් සම්බන්ධයෙන් ප්‍රශ්න මතු කොට අනිකුත් පාර්ශවකරුවන්ට ඇත්තනෝමතික ලෙස ක්‍රියා කිරීම ඉඩ නොහරිනු ලබන බවත්, 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් වෙත ගෙවීම් කිරීමට දැනට කිසිදු පිළිගත හැකි පදනමක් නොවන බවද, උගත් දිසා විනිසුරුතුමා ඔහුගේ නියෝගයේ නිරීක්ෂණය කළ බව ඔබ පිළි ගන්නෙහි ද?

26. ඔබ සහ/හෝ 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් විසින් ''සංශෝධිත සැලසුම්'' ලෙසින් විස්තර කෙරුණු නව නිර්මාණ සැලසුම් කට්ටලයක් 1985 ජූලි මස දී ඉදිරිපත් කරනු ලැබූ බව ඔබ පිළි ගන්නෙහි ද?

27. ''සංශෝධිත සැලසුම්'' ලෙස විස්තර කෙරුණු නව නිර්මාණ සැලසුම් කට්ටලයක් ඉහත කී පරිදි ඉදිරිපත් කරුනු ලැබුවේ 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුදැනුම සහ/හෝ ප්‍රකාශිත අනුමැතියක් සහ/හෝ බලයක් නොමැතිව බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම්, ඒ මන්ද?

28. පැමිණිලිකරුගේ ඉල්ලීම පිට කොළඹ හිල්ටන් හෝටලය ඉදි කිරීමේ ප්‍රගතිය පිළිබඳ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගෙන් සහ ඔබගෙන් ඉල්ලමින්, 1985 ජූනි සහ 1985 ජූලි මාසවල පැවති 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී තීරණය කරනු ලැබූ බව ඔබ දන්නෙහි ද?

29. 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එකී ඉල්ලීම පිළිබඳව 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් ඔබට දැනුම් දුන්නේ ද? එසේ නොකළේ නම්, ඔවුන් විසින් එසේ කළ යුතුව තිබුණා නොවේ ද?

30. අලුත් නිර්මාණ සැලසුම් කට්ටලයක් ''සංශෝධිත සැලසුම්'' ලෙස විස්තර කරමින්, ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කිරීම ඉහත කී අධ්‍යක්ෂ මණ්ඩල තීරණය හිතාමතාම කඩ කිරීමක් සහ උල්ලංඝණය කිරීමක් බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නොවන්නේ නම් ඒ මන් ද?

31. ''සංශෝධිත සැලසුම්'' ලෙස හෝ අන් අයුරකින් විස්තර කෙරුණු අලුත් නිර්මාණ සැලසුම් කට්ටලයක් නැවත ඇඳීමට 4 වැනි විත්තිකාර සමාගමේ ප්‍රකාශිත ලිඛිත බලයක් සහ/හෝ අනුමැතියක් ඔබට නොතිබුණු බව ඔබ පිළි ගන්නෙහි ද?

32. 4 වැනි විත්තිකාර සමාගමේ එවැනි අනුමැතියක් සහ/හෝ බලයක් ලබාගත යුතුව නොතිබුණේ ද? එසේ නම්, ඒ මන් ද?

33. මුල් නිර්මාණ සැලසුම්වලට ''සංශෝධන'' අඩංගු බවට ඉසව්ගත කරමින් ඔබ විසින් 1985 ජූලි පමණ හෝ ඊට ආසන්නයේ දී කෙලින්ම නාගරික සංවර්ධන අධිකාරිය අමතා එම අධිකාරිය වෙත උපලේඛණ ඉදිරිපත් කර ඇති බව ඔබ පිළි ගන්නෙහි ද?

34. එසේ කෙලින්ම නාගරික සංවර්ධන අධිකාරිය වෙත එවැනි සංශෝධන පිළිබඳව වූ උපලේඛණ ඉදිරිපත් කිරීමට ඔබට 4 වැනි විත්තිකාර සමාගමේ ප්‍රකාශිත ලිඛිත අනුමැතිය සහ/හෝ බලය තිබුණෝ ද? එසේ තිබුණෝ නම්, එය කවුරුන්ගෙන් ද?

35. එවැනි අනුමැතියක් සහ/හෝ අවසරයක්, 4 වැනි විත්තිකාර සමාගමෙන් ලබාගත යුතුව නොතිබුණෝ ද? එසේ නැතිනම් ඒ මන්ද?

36. සාමාන්‍යයෙන් නියමිතව ඇති සහ අවශ්‍ය වන පරිදි ''සංශෝධිත සැලසුම්'' ලෙස විස්තර කරමින් ඉදිරිපත් කරනු ලැබූ ඉහත කී අළුත් නිර්මාණ සැලසුම් කට්ටලය මත කොළඹ හිල්ටන් හෝටලයේ අයිතිකරු වන 4 වැනි විත්තිකාර සමාගමේ, එනම් හිල්ටන් අයිතිකරුගේ අත්සන සහ නිළ මුද්‍රාව ලබා ගැනීමට නිර්මාණ ශිල්පීන් වශයෙන් ඔබ හිතාමතාම නොසලකා, අපොහොසත් වී ඇති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නම් ඒ මන්ද?

37. ඔබ 4 වැනි විත්තිකාර සමාගමෙන් එම නිළ අත්සන සහ මුද්‍රාව ලබාගත යුතුව තිබුණා නොවේ ද? නොඑසේ නම්, එසේ නොකළේ මන්ද?

38. සැලසුම් සහ අධීක්ෂණ ගිවිසුමේ නියමයන් යටතේ ''සංශෝධිත සැලසුම්'' ලෙස විස්තර කළ අළුත් නිර්මාණ සැලසුම් කට්ටලයක් 1985 ජූලි මස නැවත ඇඳ ඉදිරිපත් කිරීමට 4 වැනි විත්තිකාර සමාගමේ ලිඛිත ප්‍රකාශිත අනුමැතිය සහ/හෝ බලය ඔබ විසින් ලබාගත යුතුව තිබුණු බව ඔබ පිළි ගන්නේ ද? එසේ නැත්නම් ඒ මන්ද?

39. එම නිර්මාණ සැලසුම් නැවත ඇඳීමට සහ/හෝ කිසිදු ආකාරයක හෝ එවැනි සංශෝධනයන් කිරීමට 4 වැනි විත්තිකාර සමාගමේ එවැනි ලිඛිත ප්‍රකාශිත අනුමැතියක් සහ/හෝ බලයක් ඔබට ලැබුණෝ ද? එසේ නොලද්දේ නම්, ඒ මන්ද? එසේ ලැබුණෝ නම්, එවැනි ලිඛිත ප්‍රකාශිත අනුමැතියක් සහ/හෝ බලයක් ලැබුණෝ කවරෙකුගෙන් ද?

40. ''සංශෝධිත සැලසුම්'' හෝ අන් ආකාරයකින් විස්තර කෙරෙන අළුත් නිර්මාණ සැලසුම් කට්ටලයක් නැවත ඇඳීමට ඔබට 4 වැනි විත්තිකාර සමාගමෙන් එවැනි කිසියම් ලිඛිත ප්‍රකාශිත අනුමැතියක් සහ/හෝ බලයක් නොතිබිම ඉහත කී සැලසුම් සහ අධික්ෂණ ගිණුමේ කොන්දේසීන් කඩ කිරීමක් සහ/හෝ උල්ලංඝණය කිරීමක් බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

41. එපමණක් ද නොව, වෘත්තීය නිර්මාණ ශිල්පීන් වශයෙන් ඔබ, කොළඹ හිල්ටන් හෝටලයේ අයිතිකරුගෙන් එනම්, 4 වැනි විත්තිකාර සමාගමෙන් එවැනි ප්‍රකාශිත ලිඛිත බලයක් සහ/හෝ අනුමැතියක් ලබාගත යුතුව තිබුණු බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නොවේ නම්, එසේ නොකළේ මන්ද?

42. 1985 ජූලි මසදී ''සංශෝධිත සැලසුම්'' වශයෙන් විස්තර කෙරුණු අළුත් නිර්මාණ සැළසුම් කට්ටලයක් ඉහත කි අයුරින් ඉදිරිපත් කිරිම නොයෙකුත් ගිවිසුම්වල කොන්ත්‍රාත්තුවල නියත විධිවිධානයන් කඩ කිරිමක් සහ උල්ලංඝනය කිරිමක් වන බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නොවන්නේ නම්, එ මන්ද?

43. ''සංශෝධිත සැළසුම'' වශයෙන් ඉහත කී අළුත් නිර්මාණ සැළසුම් කට්ටලයක් ඉදිරිපත් කිරිමෙන්, ශ්‍රී ලංකා රජයත් ඇතුළුව අයෝජන ගිවිසුමට ඇතුළත් වන සියලුම පාර්ශවකරුවන් විසින් එවැනි සංශෝධනයකට ඇතුලත් වියයුතු බවට නියම කෙරෙන ඒ සම්බන්ධයෙන් වූ ආයෝජන ගිවිසුමේ විධිවිධානයන් උල්ලංඝනය කිරිමක් සහ කඩ කිරිමක් සිදු කරනු ලැබ ඇති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නොවූයේ නම්, ඒ මන්ද?

44. පිළිවෙලින්, 1984 ජනවාරි සහ 1984 මාර්තු මාසවල දී 4 වන විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරනු ලැබුවා වූ මුල් නිර්මාණ සැලසුම්වල සියලුම පිටපත් 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ ඉදි කිරිම් වැඩබිම් කාර්යාලයෙහි ඇති වූ ගින්නෙන් දැවී විනාශ විය නොහැකි බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම්, ඒ මන්ද?

45. 4 වන විත්තිකාර සමාගමේ කාර්යාලය භාරයේ තිබූ ඉහත කී නිර්මාණ සැලසුම්වල අයිතිකරුගේ පිටපත ප්‍රශ්නයට තුඩුදෙන අයුරින් අස්ථානගත වී සහ/හෝ චුවමනාවෙන්ම වසන්කොට ඇති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නොමැති නම්, ඒ මන්ද?

46. ඔබගේ වැඩ අවසන් සහතිකය සහ අවසන් සහතිකය හුදෙක් සාමාන්‍ය ''වෛi සහතික'' ස්වභාවයක ලිපි බව ඔබ පිළි ගන්නෙහි ද? තවද, ''සංශෝධිත සැලසුම්'' වශයෙන් පසු කලෙක දී ඉදිරිපත් කරනු ලැබූ අළුත් නිර්මාණ සැලසුම් කට්ටලයකට ඒවා සම්බන්ධ කරුණ ඔබ විසින් එළිදරව් කිරිමට අපොහොසත් වී සහ/හෝ චුවමනාවෙන්ම වසන් කොට ඇති බව ඔබ පිළිගන්නෙහි ද? එසේ නොමැතිනම් ඒ මන්ද?

47. ඔබගේ ඉහත කී සහතික සනාථ කිරිමට සහ/හෝ කොළඹ හිල්ටන් හෝටලය ඉදි කිරිමේ හරි වැරදි බැලීමට ද්‍රව්‍ය නියම කළ පරිමාණ බිල්පත් සහ අවසාන මිනුම් 4 වැනි විත්තිකාර සමාගමට නැති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නොතිබුනේ නම්, ඒ මන්ද?

48. එම කොළඹ හිල්ටන් හෝටලයට ගෘහ භාණ්ඩ සවිකරන දේ සහ උපකරණ සැපයීම් පිළිබඳ විෂය ප්‍රමාණය විස්තර දැක්වුණු සැපයුම් කොන්ත්‍රාත්තුවට 'ඒ' ප්‍රදර්ශිතය ද ප්‍රශ්නයට තුඩු දෙන අයුරින් නැතිවීම සහ/හෝ සිතාමතාම 4 වැනි විත්තාකර සමාගමේ කාර්යාලයෙන් යටපත් කොට ඇති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නම් ඒ මන්ද?

49. ඉහත කී සැපයුම් කොන්ත්‍රාත්තුවේ 'ඒ' ප්‍රදර්ශිතය නොමැතිව කොළඹ හිල්ටන් හෝටලයට ගෘහ භාණ්ඩ, සවි කරන දේ සහ උපකරණ සැපයුම්වල වර්ගයක් නියමිතයන් සහ ප්‍රමාණයන් හි හරි වැරදි බැලීමට 4 වැනි විත්තිකාර සමාගමට නුපුළුවන් බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම්, ඒ මන්ද?

50. ඉහත කී ණය ගිවිසුම් යටතේ, ඔවුන් විසින්ම ඔවුන් වෙත සපයනු ලැබූ ණය මුදල්වලින් ඉහත නම් සඳහන් 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් ගෙවීම් ලබාගන්නා ලද්දේ හුදෙක් කාලයාගේ ඇවෑමෙන් වූ පදනම මත බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඔවුන් ගෙවීම් ලබා ගත්තේ කුමන පදනමක් මත ද?

51. එකී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් විසින් එවැනි ගෙවීම් ලබාගැනිමට ඔබ විසින් සම්ප්‍රදායික ලෙස නිකුත් කරනු ලැබූ වැඩ පිළිබඳව අතුරු සහතික නොතිබුණු බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම්, එම ගෙවීම් සහතික කිරිමේ සහතික ඇත්තේ කොහේ ද?

52. ඉහත කී නොයෙක් වැදගත් ලියකියවිලි නොමැතිකමින් ගිවිසගත් ද්‍රව්‍යවල වර්ගය, නියමයන්, ප්‍රමාණය සහ වටිනාකම පරිදි ගෘහ භාණ්ඩ සහ උපකරණවලින් සමන්විත කළ කොළඹ හිල්ටන් හෝටලයේ ඉදිකිරිම සහ භාරදීම පිළිබඳ හරි වැරදි සොයා බැලීමට 4 වැනි විත්තිකාර සමාගමට නොහැකි බව ඔව දන්නේ ද? එසේ නැතිනම් එවැනි නිවැරදිතාවයක් පරික්ෂා කර බැලිය හැක්කේ කෙසේ ද?

53. ඉහත සඳහන් සම්බන්ධතාවයන් අනුව 4 වැනි විත්තිකාර සමාගම විසින් 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකාරයන් වෙත ගෙවීම් කිරිමට එම සමාගමට වලංගු සතුටුදායක සහ පිළිගත හැකි පදනමක් නොමැති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම්, ඒ මන්ද?

54. මෙම නඩුවේ විමසීමකින් පසුව උගත් දිසා විනිසුරුතුමා අතුරු තහනම් නියෝග නිකුත් කරමින් දෙනු ලැබූ ඔහුගේ නියෝගයේ වෙනත් කරුණු අතර, 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් වෙත ගෙවීම් කිරිමට දැනට පිළිගත හැකි පදනමක් නොවන බව නිරික්ෂණය කොට ඇති බව ඔබ පිළි ගන්නෙහි ද?

55. කොළඹ හිල්ටන් හෝටලය වෙනත් දෑ අතර, කාමර 452 ක් (එනම් හෝටල් අමුත්තන්ගේ කාමර කළමනාකරුගේ වාසස්ථානය වශයෙන් කාමර හතරක් ඉවත් කොට) මහල් 22 ක් උසට විහිදෙන සහ රථවාහන 400 ක් සඳහා ආවරණය වූ (එනම් පතුල් මහල්) රථ

ගාලකින් සමන්විත වනු ලබන බව, ඔබ ද දායක වූ 4 වැනි විත්තිකාර සමාගමේ ව්‍යාපාර ප්‍රකාශ පත්‍රයේ ශ්‍රී ලංකාවේ අයෝජනය කරන මහජනයාට සහ අදාළ ව්‍යවස්ථාපිත බලධාරීන්ට කියා පා තිබෙන බව ඔබ දන්නෙහි ද? නොඑසේ නම් ඒ මන්ද?

56. 1985 ජූලි මස ''සංශෝධිත සැලසුම්'' වශයෙන් විස්තර කර ඇති නිර්මාණ සැලසුම් ඉහත කී නැවත ඇඳීම ඔබ විසින් සිදු කිරීමට පෙරාතුවම මාගේ 1985 අප්‍රේල්/මැයි කාලයේ දී හෝ එයට ආසන්නයේ දී ටෝකියෝ හි දී ඔබත්, ඉහත කී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවනුත් හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනය සහ 5 වැනි විත්තිකරුත් අතර රැස්වීම් පැවැත්වූ බව ඔබ පිළි ගන්නෙහි ද? නොඑසේ නම් ඒ මන්ද?

57. 1990 පෙබරවාරි/මාර්තු පමණ හෝ ඊට ආසන්නයේ දී මුදල් අමාත්‍යාංශයේ දී සිදුවූ සාකච්ඡා අතරතුර ඉහත නම සඳහන් 5 වැනි විත්තිකරු, 8 වැනි විත්තිකරු සහ මුදල් අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ටී.එම්.වයි.කාසිචෙට්ටි මහත්මිය ඉදිරියේ දී අභිමුඛව අසන ලදුව, ''සංශෝධිත සැලසුම්'' වශයෙන් ඉදිරිපත් කර ඇති නැවත අඳින ලද අත් නිර්මාණ සැලසුම් කට්ටලයේ අමුත්තන්ගේ කාමර මහල් දෙකක් අඩු කිරීම 5 වැනි විත්තිකරු විසින් පිළිගත් අතර, ආවරණ රථ ගාල් කිරීමේ කුටි සංඛ්‍යාවේ පහත වැටීමේ ප්‍රතිඵලයක් වූ පතුල් මහල පිළිබඳව ගිවිසීම ද පෙන්නුම් කර දෙන ලද්දේ ද එම 5 වැනි විත්තිකරු විසින් ම බව ඔබ පිළි ගන්නෙහි ද?

58. (පැ.8) වශයෙන් සලකුනු කොට මෙම නඩුවට ගොනු කර ඇත්තාවූ 1980 ජූලි මස දිනැති ඔබගේ නිර්මාණික සැලසුම්වල සම්මත ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර කුටි/කාමර සම්මත මාපක 456 ක් කුළුණු දෙකක තිබෙන බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

59. තරු පහේ පන්තියේ ජාත්‍යන්තර හෝටල් සඳහා වූ ප්‍රමිතීන්ට අනුකූලව ඔබගේ ඉහත කී (පැ.8) නිර්මාණ සැලසුම්වල තිබෙන අමුත්තන්ගේ කාමර කුටි/කාමර මාපකවල සම්මත ප්‍රමාණය හතරැස් මීටර 33 ක් වූණ බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

60. එවැනි සම්මත ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර කුටි/කාමර මාපක සාමාන්‍යයෙන් සම්මත ද්විත්ව පදිංචි හෝටල අමුත්තන්ගේ කාමර වශයෙන් විකුණනු ලබන බව සහ විධායක කාමර සංයුක්ත කිරීමට එවැනි සම්මත ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර කුටි/කාමර ඒකක දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඒකාබද්ධ කරනු ලබන බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

61. ඉහත කී (පැ.8) නිර්මාණ සැලසුම්වල එක කුළුණක සෑම විසිත්ත කාමර තට්ටුවකම එවැනි සම්මත ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර කුටි/කාමර මාපක 12 බැගින් ඇති බවත්, කුළුණු දෙකෙහිම මුළු සංඛ්‍යාව ගත් කල්හි, එවැනි සම්මත ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර කුටි/මාපක 24 ක් තිබෙන බව ඔබ පිළිගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

62. මේ අනුව, ඉහත සඳහන් නිර්මාණ සැලසුම්වල (පැ.8) ඉහත සඳහන් සම්මත ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර කුටි/මාපක 456 මුළු සංඛ්‍යාවම, එක් කුළුනක අමුත්තන්ගේ කාමර තට්ටු 19 ක අඩංගු වුන බව ඔබ පිළි ගන්නේ ද? එසේ නැතිනම් ඒ මන්ද?

63. මේ අනුව එක් කුළුනක අමුත්තන්ගේ කාමර තට්ටුවක සම්මත ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර කුටි/මාපක 12 x අමුත්තන්ගේ කාමර තට්ටු 19 x ඉහත සඳහන් පරිදි කුළුණු 02 = ඉහත කී නිර්මාණ සැලසුම් (පැ.8) හි කුළුණු 02 හි අඩංගු සම්මත ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර කුටි/ඒකක 456 බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

64. ඔබ විසින් 1985 ජූලි මස දී ''සංශෝධිත සැලසුම්'' වශයෙන් විස්තර කරමින් ඉදිරිපත් කරනු ලැබූ අළුත් නිර්මාණ සැලසුම් කට්ටලෙහි ඇත්තේ එක් කුළුණක අමුත්තන්ගේ කාමර තට්ටු 17 ක් පමණක් බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැති නම් ඒ මන්ද?

65. එමනිසා එවැනි අමුත්තන්ගේ කාමර තට්ටු අඩු සංඛ්‍යාවක් වූ 17 ක ඉහත සඳහන් පරිදි අමුත්තන්ගේ කාමර කුටි/මාපක 456 ක් තිබිය නොහැකි බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

1992 මාර්තු මස 06 වන දිනදී ය.

(Signature)

පැමිණිලිකරුගේ නීතිඥයින්.